# ආයුබෝවන්



# ජාතික කෞතුකාගාර පුස්තකාලයේ එකතුව හා සේවාවන්

ජී.එස්. චූලනී
සහකාර පුස්තකාලයාධිපති
ජාතික කෞතුකාගාර පුස්තකාලය

සාම්ප්‍රදායික පොත්ගුල් සම්ප්‍රදායෙන් මිදුණු බටහිර ආකෘතිගතව මෙරට බිහිවුණු ප්‍රධාන පුස්තකාලය වශයෙන්ද නීතිමය ආඥා පනතකින් ස්ථාපිත  කරන ලද විශාලම පොත් එකතුවක් ඇති පුස්තකාලය ලෙසද ජාතික කෞතුකාගාර පුස්තකාලය හඳුන්වාදිය හැකිය.

# දැක්ම

දකුණු ආසියාවේ තිබෙන කෞතුකාගාර පුස්තකාල අතුරින් විශිෂ්ටතම පුස්තකාලය බවට පත් කිරීම.

# මෙහෙවර

ජාතික සංවර්ධනය ලඟාකර දැනුමෙන් සපිරි ශ්‍රී ලංකික සමාජයක් බිහි කිරීම සඳහා ශක්තියක් ලබාදීම.

# ඉතිහාසය

- ජාතික කෞතුකාගාර පුස්තකාලය ආරම්භ වන්නේ 1873 අංක 31 දරණ අඥා පනත අසුරෙනි.

- එවකට ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි ආණ්ඩුකාර ධූරය ඉසිලූ සර් විලියම් ග්‍රෙගරි විසින් කෞතුකාගාරය පිහිටුවීමේ අරමුණ 1873 ජනවාරි 15 ව්‍යවස්ථාදායක සභාවට මෙලෙස විස්තර කළේය.

“ අධ්‍යාපන කටයුතුවල යෙදෙන සෑම අයෙකු වෙනුවෙන්ම පුස්තකාලය පිහිටුවීම මාගේ අදහසයි. එය බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ මෙන් පවත්නා සෑම විෂයක් පිළිබඳවම පොත් අන්තර්ගත නොවනු ඇත.........”

මෙම යොජනාව ව්‍යවස්ථාදායක සභාව විසින් පිළිගත් අතර පුස්තකාලයද කෞතුකාගාරය විවෘත කළ දිනයේම එනම් 1877 ජනවාරි 01 වන දින විවෘත කරන ලදී

# කෞතුකාගාර පුස්තකාලයේ ආරම්භක එකතුව.


- 1870 පිහිටුවන ලද රජයේ ප්‍රාචීන පුස්තකාලයේ අත්පිටපත් එකතුව.
- රාජකීය ආසියාතික සංගමේ පරිත්‍යාග.
- වෙනත් මහතෙකුගේ පරිත්‍යාග.
- මිලට ගත් අත් පිටපත්.
- පොත් සහ වාර සඟරා.
- වෙනත් රාජ්‍ය ලේඛන.

මෙම ග්‍රන්ථ සම්භාරය ක්‍රමයෙන් වැඩිවූ අතර වර්තමානය වන විට ලක්ෂ 12ක පමණ ලේඛන මෙහි තැන්පත් කර ඇත.

කෞතුකාගාර පුස්තකාලයේ ප්‍රථම පුස්තකාලයාධිපතිවරයා වනුයේ ශ්‍රීමත් රිච්ඩ් වැන්කියුලුැන්බර්ග් මහතාය.
(1877-1885)

වර්තමාන පුස්තකාලයාධිපති ඇතුළුව මේ දක්වා පුස්තකාලයාධිපතිවරු 14 දෙනෙක් මෙහි පුස්තකාලයාධිපති තනතුර හොබවා ඇත.


# එකතුව













## මෙම එකතුව ප්‍රධාන වශයෙන් කොටස් 2කට බෙදිය හැකිය.

ග්‍රන්ථ එකතුව

| මුද්‍රිත | අමුද්‍රිත |
|---|---|
| මුද්‍රිත ග්‍රන්ථ | අත්පිටපත් |
| රාජ්‍ය ප්‍රකාශන | පුස්කොළ පොත් |
| සඟරා | |
| සූක්ෂම සේයා | |
| සිතියම් | |
| මුද්දර හා තැපැල්පත් | |

# මුද්‍රිත

## 1 මුද්‍රිත ග්‍රන්ථ

නීතිමය තැන්පතුව යටතේ පුස්තකාලයට හිමි වන ග්‍රන්ථ හා පරිත්‍යාග වශයෙන් ලැබෙන ග්‍රන්ථ මීට අයත් වේ. 1737 පළමු මුද්‍රිත ග්‍රන්ථයේ සිට මේ දක්වා ප්‍රකාශිත ග ‍්‍රන්ථ මීට අයත් වේ.

## 2 සඟරා

නීතිමය තැන්පතුව යටතේ පුස්තකාලයට හිමි වන දේශීය සඟරා මෙන්ම විදේශීය සඟරාද මෙයට අයත් වේ. සඟරා කොටස් 4 ක් යටතේ වර්ග කළ හැකිය.

# සඟරා

- දේශීය කලා සඟරා
- දේශීය විද්‍යා සඟරා
- විදේශීය කලා සඟරා
- විදේශීය විද්‍යා සඟරා

දකුණු ආසියාවේ විශාලම හා හොඳම විද්‍යා සඟරා එකතුව ඇත්තේ කෞතුකාගාර පුස්තකාලයේය.

# 3 රාජ්‍ය ප්‍රකාශන

- ගැසට් - 1802 සිට මේ දක්වා
- පාලන වාර්ථා - 1867 සිට මේ දක්වා
- සැසිවාර්ථා - 1860 සිට මේ දක්වා
- හැන්සාඩ් - 1870 සිට මේ දක්වා
- සිවිල් ලැයිස්තු - (1863 - 1970)
- පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා
- නීති වාර්තා
- නිල් පොත්
- තොරතුරු සංග්‍රහ
- ලිත්
- අණ පනත්

4 සිතියම්

දේශීය හා විදේශීය වශයෙන් වර්ග කළ සිතියම් එකතුවක් තිබේ.

5 චිත්‍ර

පැන්සල් හා දිය සායම් ලෙස කොටස් 2 කට අයත් චිත්‍ර මෙහි තැන්පත් කර තිබේ.

## අමුද්‍රිත

### 1 අත්පිටපත්

විවිධ පර්යේෂකයන් ලේඛකයන් විවිධ වූ කාලසීමන් වලදී රචනා කරන ලද අත් පිටපත් එකතුවක් පුස්තකාලය සතුයි

### 2 පුස්කොළ පොත්

පුස්තකාලය සතුව දැනට 5300 ක පමණ පුස්කොළ පොත් එකතුවක් තිබේ. විවිධ පුද්ගලයින් විසින් පරිත්‍යාග කරන ලද පුස්කොළ පොත් මෙහි අන්තර්ගත වේ.

### 3 සූක්ෂම සේයා

පුස්තකාලයේ සංරක්ෂණ ක්‍රියා මාර්ගයක් ලෙස වටිනා මුද්‍රිත හා අමුද්‍රිත පොත් සූක්ෂම සේයා ගත කර තැන්පත් කර තිබේ.

## මීට අමතරව වටිනා හා දුර්ලභ පොත් එකතුවක් කෞතුකාගාර පුස්තකාලය සතුව තිබේ. එනම්

- චුල්ල වග්ග පාළිය  පුස්කොළ පොත
- ලංකාවේ පළමු සිංහල මුද්‍රිත පොත
- බලදේයන් පියනමගේ ලංකාව පිළිබඳ ග්‍රන්ථය
- ජුවාන් රිබෙයිරෝගේ ලංකාව පිළිබඳ ග්‍රන්ථය
- ශ්‍රී ලංකාවේ ප්‍රකාශකරන ලද පළමු පුවත් පත

1 චුල්ල වග්ග පාළිය  පුස්කොළ පොත
දැනට ලංකාවේ සොයා ගෙන ඇති පැරණිම
පොතයි 13 වැනි ශතවර්ෂයට අයත් යැයි
සැලකේ පරාක්‍රමබාහු රාජ්‍ය කාලයේ බෙලිගල
සුමේධ හිමි විසින් පිටපත් කළ බව අවසාන
පිටුවේ සඳහන් වේ



# 2 ලංකාවේ පළමු සිංහල මුද්‍රිත පොත

1737 අප්‍රේල් මස සිංහල යාච්ඥා පොත ප්‍රථම වරට මුද්‍රණය කරන ලදී.





4 ජුවාන් රිබෙයිරෝගේ ලංකාව පිළිබඳ ග්‍රන්ථය

මෙය 1685 දී ප්‍රකාශ කරන ලදී නැවතත් 1701 1836 1847
යන වර්ෂ වලදී ප්‍රකාශයට පත්කරන ලදී
අප පුස්තකාලය සතුව ඇත්තේ 1701 දී ප්‍රකාශයට පත් කළ
කෘතියයි

3 බලදේයන් පියනමගේ ලංකාව පිළිබඳ ග්‍රන්ථය

පිලිපස් බලදේයන් නමැති ඕලන්ද ජාතික පූජකවරයෙකු විසින් 1672 ප්‍රකාශයට පත්කරන ලදී.

## 5 ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් කරන ලද පළමු පුවත්පත

1802 මාර්තු මස 15 වන දින නිකුත් කරනු ලැබූ
ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පිටපතක් අප
පුස්තකාලයේ සුරක්ෂිත වී ඇතඑහි ආණ්ඩුවේ
නිවේදන පමණක් නොව දේශපාලන
හා සාහිත්‍යමය කරුණුද අඩංගු වී තිබේ

දුර්ලභ හා වටිනා කෘතීන් අතර පහත සඳහන් කෘතීන්ටද වැදගත් තැනක් හිමි වේ.

ලංකාවේ අටවසරක්
(Eight years in the Ceylon)

ලංකාවේ කුරුල්ලන්ගේ ඉතිහාසය
A History of the Birds of Ceylon

සුලභාවතී කථාව

යකුන් නටනවා කෝළන් නටනවා

Lapidarium Zeylanicum

කෞතුකාගාර පුස්තකාලය සතුව දුර්ලභ එකතූන් කිහිපයක් තිබේ

ඒ අතර

- කවි කොළ එකතුව
- මුද්දර හා තැපැල්පත් එකතුව
- අනුමත සිංහ කොඩියේ අනුරුව






# සේවාවන්









ශ්‍රී ලංකාවේ විශාලතම ග්‍රන්ථ එකතුවක් ඇති පුස්තකාලය බැවින් අති විශාල වූ සේවාවක් පාඨකයා වෙත සැපයීමට සමත්ය. ඒ අතුරින් සුවිශේෂී සේවාවන් මෙසේයි

- විමර්ශන සේවය
- සුචිකරණය හා අනුක්‍රමණිකාකරණය
- ඡායා පිටපත් සේවය හා සූක්ෂම ඡායා පිටපත්
- ග්‍රන්ථ නාමාවලී සේවාව
- දුරකතන මගින් ලිපි මගින් විමර්ශන සැපයීම
- පරිගණක ගත සුචිකරණ සේවා

1 විමර්ශන සේවය

ශ්‍රී ලංකාවේ විශාලතම විමර්ශන පුස්තකාලය මෙයයි. පුස්තකාලයේ ප්‍රධානම පරමාර්ථය වන්නේ සුරක්ෂිත භාවිතය හා සංරක්ෂණායයි. පොත් වලට වියහැකි හානි වළක්වාලීම අරමුණු කරගෙන විමර්ශන පුස්තකාලයක් බවට පත්ව ඇත. මෙහිදී

- මුද්‍රිත හා අමුද්‍රිත එකතුන් පාඨකයා සඳහා විමර්ශන හා පරිශීලනයට ලබා දීම
- ඉතාමත් කෙටිකාලයක් තුළ අවශ්‍ය තොරතුරු ඇතුළත් දැනුම් ද්‍රව්‍ය පාඨකයා වෙත සැපයීම.

## 2 සූචිකරණය හා අනුක්‍රමණිකාකරණය·

පුස්තකාලයේ ග්‍රන්ථ එකතුව අතිමහත් හෙයින් පැරණි මුද්‍රිත පොත් පුස්කොළ පොත් ආදිය සඳහා සූචි සකස් කර ඇත සූචිය

1 විෂය

2 කර්තෘ

වශයෙන් කොටස් 2කට දක්වා ඇත.

## අනුක්‍රමණිකාකරණය

පුස්තකාලයේ සඟරා සඳහා අනුක්‍රමණිකාව සකසා ඇත. මෙය දේශීය, විදේශීය කලා හා විද්‍යා සඟරා සඳහා අනුක්‍රමණිකා සකසා ඇත. මේ සියල්ලම අකාරාදි අනුක ්‍රමණිකා වේ.

උදා - පුස්කොළ පොත් අනුක්‍රමණිකාව

W.A සිල්වා මහතා විසින් සකසන ලද අනුක්‍රමණිකාව

# ඡයාපිටපත් හා සූක්ෂම පිටපත්

පාඨක අවශ්‍යතාවයන් මත මෙම සේවාවන් සැපයීම සඳහා කොන්දේසි ප්‍රමාණයකට යටත්ව අවශ්‍ය පහසුකම් සලසා ඇත. එනම්

- ඡයාපිටපත් ලබා ගත හැක්කේ 1940න් පසු ග්‍රන්ථ වල පමණි.
- පොතක 1/3 ප්‍රමාණයක් පමණක් ඡයාපිට පත්කරනු ලබයි.
- පැරණි ග්‍රන්ථවල හෝ පුස්කොළපොත් වල පිටපත් අවශ්‍යනම් සූක්ෂම පිටපත් යටතේ ලබා ගත හැක.
- සූක්ෂම සේයා නොකළ ග්‍රන්ථ සඳහා ඡයාරූප ලබා ගැනීම සිදුවන අතර එක් ඡයා රූපයකට රු 100 බැගින් හා කැමරා බලපත්‍රයකට රු 250 බැගින් අයකරනු ලබයි.

# ග්‍රන්ථනාමාවලී සේවය

පුස්තකාලයේ විවිධ එකතූන් සඳහා ග
්‍රන්ථනාමාවලී ඉදිරිපත්කර ඇත.

- කලා මණ්ඩලයේ පොත් එකතුව
- කළුකොඳයාවේ පඥාශේකර හිමි පොත් එකතුව



# දුරකථන මගින් ලිපි මගින් විමර්ශන සැපයීම

පුස්තකාලයට ලැබෙන පාඨක ඇමතුම් වලට හා ලිපි මගින් විමසීම් සඳහා කෙටිකාලයක් තුළදී විමර්ශන මූලාශ්‍ර ඇසුරින් පිළිතුරු සපයනු ලබයි.

පරිගණක ගත සුචිකරණසේවා
පුස්තකාලය ස්වයංක්‍රීයකරණය සඳහා
PURNA මෘදුකාංගය දායකකරගෙන
ඇත. එහි දත්ත ඇතුළත් කිරීම
අවසන් අදියරේ පවතින බැවින්
නොබෝ කළකින් මාර්ගගත සුචියක්
වශයෙන් දෙපාර්තමේන්තු වෙබ්
අඩවියෙන් තොරතුරු ගවේෂණය
කළහැකිය.

## ඉදිරියට ඇති සැලසුම්

- සඟරා සඳහා පටුන පිටු සේවයක් ආරම්භ කිරීම
- පරිගණක සුවිය අන්තර්ජාලයට එක් කිරීම
- පුස්තකාලයට විද්‍යුත් තොරතුරු සේවා ලබා ගැනීමට කටයුතු කිරීම
- උදා: e-books, e-magazing
- පුස්තකාලය තුළ අන්තර්ජාල පහසුකම් සහිත පරිගණක පද්ධතියක් මගින් තොරතුරු ගවේශනය සඳහා අවකාශ සැලසීම




ස්තූතියි...